# 2 පරිච්ඡේදය

# මූල්‍ය පද්ධතියේ තත්ත්වයන්

## සාරාංශය

2024 වසර තුළ දී මූල්‍ය අංශයේ සමස්ත කාර්යසාධනය අඛණ්ඩව වැඩිදියුණු වූ අතර, ඇතැම් අභියෝග තවදුරටත් දක්නට ලැබුණි. බැංකු අංශය විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූලත්වය දක්වන ලද අතර, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක නියාමන සීමාවන්ට ඉහළින් රඳවා ගනිමින් ස්ථායීතාව පවත්වා ගන්නා ලදී. මෙම වර්ධනයන් මධ්‍යයේ, ආයෝජන සහ ණය හා ලැබිය යුතු දෑ වල ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී බැංකු අංශයේ මුළු වත්කම් වර්ධනය විය. බැංකු අංශයේ වගකීම් පිළිබඳව සලකා බැලීමේ දී, එම අංශය සඳහා විශාලතම අරමුදල් ප්‍රභවය වන තැන්පතු, 2024 වසර තුළ දී අඛණ්ඩ ප්‍රසාරණයක් වාර්තා කළේය. අක්‍රීය ණය අනුපාතය[1] අනුව, බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය මෙම වසර තුළ දී වර්ධනය වුව ද, එම අනුපාතය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, ශුද්ධ පොලී ආදායම වැඩි වීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන්, මෙම වසර තුළ බැංකු අංශයේ ලාභදායීතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මුදල් සමාගම් අංශය ද, සමාලෝචනයට භාජනය වන කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සමඟ ශක්තිමත්ව පැවතුණි. 2024 වසර තුළ දී, ප්‍රධාන වශයෙන් මුදල් සමාගම් අංශයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි සිදු වූ සැලකිය යුතු ප්‍රසාරණය හේතුවෙන් එම අංශයේ වත්කම් පදනම වර්ධනය වූ අතර, රජයේ සුරැකුම්පත්වල ආයෝජන සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, 2024 වසර තුළ දී ඉහළ ගිය ලාභදායීතාව මධ්‍යයේ මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය ද සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මේ අතර, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණය යන උප අංශ දෙකෙහිම දළ ලියාපදිංචි වාරිකවල වැඩි වීමක් 2024 වසර තුළ දී වාර්තා විය. මූල්‍ය වෙළඳපොළ පිළිබඳ සැලකීමේ දී, කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ විදේශීය ගලායෑමක් වාර්තා වුව ද, දර්ශක සහ පිරිවැටුම යන දෙආකාරයෙන්ම එහි කාර්යසාධනයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. මේ අතර, 2024 වසර තුළ දී බැංකු අංශයේ ද්‍රවශීලතාවයෙහි අසමමිතික ව්‍යාප්තියක් නිරීක්ෂණය වුව ද, දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය විය. වරින් වර ඉහළ ගිය ද, රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ද වසර තුළ දී පහත වැටුණි. රටේ මූල්‍ය යටිතල පහසුකම් තවදුරටත් සුමටව ක්‍රියාත්මක වෙමින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වයට පහසුකම් සලසන ලදී. ගෙවීම් යටිතල පහසුකම් සලකා බලන කල, ඩිජිටල් ගෙවීම් ක්‍රම අනුගමනය කිරීම අඛණ්ඩව ඉහළ ගිය අතර, ජාතික ගෙවීම් යටිතල පහසුකම්, ජාත්‍යන්තර ගෙවීම් ජාල සමඟ ඒකාබද්ධ කිරීම ද 2024 වසර තුළ දී අඛණ්ඩව සිදු විය. තවද, මහ බැංකුව විසින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වයට පහසුකම් සැලසීම ඉලක්ක කරගනිමින් අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය වැඩිදියුණු කිරීම මෙන්ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම, සහ තැන්පතු රක්ෂණ හා මූල්‍ය ආයතන නිරාකරණය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

1 තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් පිළිබිඹු වන පරිදි

**2.1 සංඛ්‍යා සටහන: මූල්‍ය අංශයේ සමස්ත වත්කම් (අ)**

| | 2023 (ආ) | | 2024 (ඇ) | |
|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) |
| **බැංකු අංශය** | **24,599.9** | **73.9** | **26,051.8** | **72.7** |
| මහ බැංකුව | 4,205.4 | 12.6 | 3,876.1 | 10.8 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 18,110.1 | 54.4 | 19,815.0 | 55.3 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 2,284.4 | 6.9 | 2,360.7 | 6.6 |
| **තැන්පතු බාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන** | **1,930.2** | **5.8** | **2,195.1** | **6.1** |
| මුදල් සමාගම් | 1,695.5 | 5.1 | 1,930.7 | 5.4 |
| සමූපකාර ග්‍රාමීය බැංකු (ඈ) | 222.1 | 0.7 | 248.3 | 0.7 |
| බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් | 11.7 | ... | 14.8 | ... |
| සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති | 0.9 | ... | 1.3 | ... |
| **විශේෂිත මූල්‍ය ආයතන** | **717.1** | **2.2** | **908.7** | **2.5** |
| විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | 1.2 | ... | 1.3 | ... |
| ප්‍රාථමික අලෙවිකරුවන් | 270.9 | 0.8 | 297.2 | 0.8 |
| කොටස් තැරැව්කරුවන් | 24.3 | 0.1 | 44.9 | 0.1 |
| ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම් | 411.6 | 1.2 | 554.2 | 1.5 |
| වෙළඳපොළ අතරමැදියන් (ඉ) | 9.1 | ... | 11.1 | ... |
| **ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන** | **6,028.3** | **18.1** | **6,678.7** | **18.6** |
| රක්ෂණ සමාගම් | 1,133.1 | 3.4 | 1,223.0 | 3.4 |
| සේවක අර්ථසාධක අරමුදල | 3,927.7 | 11.8 | 4,420.2 | 12.3 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 524.5 | 1.6 | 591.3 | 1.7 |
| අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල | 347.2 | 1.0 | 339.2 | 0.9 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 95.8 | 0.3 | 105.0 | 0.3 |
| **එකතුව** | **33,275.5** | **100.0** | **35,834.3** | **100.0** |

(අ) දත්ත නොමැතිවීම හේතුවෙන් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් මෙම සංඛ්‍යා සටහනට ඇතුළත් කර නොමැත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) දත්ත නොමැතිකම හේතුවෙන් 2024 වසර අවසානයේ සමූපකාර ග්‍රාමීය බැංකුවල වත්කම් පදනම ලෙස එම වසරේ තුන්වන කාර්තුවේ වත්කම් පදනම යොදාගෙන ඇත.
(ඉ) වෙළඳපොළ අතරමැදියන් ලෙස ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හැර.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
සණස මහා සංගමය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## 2.1 බැංකු අංශය

**ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය අවම නියාමන මට්ටම්වලට වඩා ඉහළින් පවත්වා ගන්නා අතරතුර, විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූල වෙමින් බැංකු අංශය තම ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වා ගන්නා ලදී.** බැංකු අංශය, 2024 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 61.9%කට හිමිකම් කියමින් මූල්‍ය අංශයේ ප්‍රමුඛත්වය ගන්නා ලදී. 2024 වසර අවසන් වන විට, බැංකු අංශය බලපත්‍රලාභී බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු හයකින් සමන්විත විය. බැංකු ජාලය වර්ධනය කිරීම සහ බැංකු සේවා වැඩිදියුණු කිරීම මගින් බැංකු අංශය මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව කරගෙන යන ලදී. 2024 වසර තුළ දී, බැංකු ශාඛා 13ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 368ක් ස්ථාපිත කරන ලද අතර, බැංකු ශාඛා 10ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 24ක් වසා දමන ලදී. ඒ අනුව, 2024 වසර අවසානය වන විට සමස්ත බැංකු ශාඛා/ඒකක සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව පිළිවෙළින් 7,613ක් සහ 7,286ක් දක්වා ඉහළ ගොස් ඇත.

**2024 වසර තුළ බැංකු අංශය එහි වත්කම් පදනම අනුව අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආයෝජන වැඩි වීම හේතු විය.** මෙම අංශයේ මුළු වත්කම් පදනම 2024 වසර තුළ දී රුපියල් බිලියන 1,781.3කින් වැඩි වී වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 22.2ක් ලෙස වාර්තා වූ අතර, 2023 වසර අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 5.0%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ 8.7%ක වර්ධනයක් වාර්තා කරන ලදී. වත්කම් ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක වූ ආයෝජන, 2024 වසර තුළ රුපියල් බිලියන 1,783.8කින් වැඩි වූ අතර, 2023 වසර අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 23.1%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී 24.4%ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2023 වසරේ ජූනි මාසයේ සිට වරින් වර ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාත අඩුකිරීම් හරහා මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ වෙළඳපොළ ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස ඉහළ යෑම, ණය වර්ධනයේ පහත වැටීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමට සහ වත්කම්වල ගුණාත්මකභාවයේ පිරිහීම පාලනය කිරීමට හේතු විය. ඒ අනුව, ණය සහ ලැබිය යුතු දෑ, 2023 අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2.6%ක සංකෝචනයේ සිට, 2024 අවසානයේ දී 4.1%ක වර්ධනයක් දක්වා වැඩි විය.

**2024 වසර අවසානයේ දී බැංකු අංශයේ සමස්ත වගකීම්වලින් හා හිමිකම්වලින් 81.0%ක් නියෝජනය කරන ලද තැන්පතු, බැංකු අංශයේ අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, හිමිකම් සහ ණය ගැනීම් සමස්ත**

**2.2 සංඛ්‍යා සටහන: බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය**

| වර්ගීකරණය | 2023 අවසානයට (අ) | 2024 අවසානයට (ආ) |
|---|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | |
| i.මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව | **24** | **24** |
| දේශීය බැංකු | 13 | **13** |
| විදේශීය බැංකු | 11 | **11** |
| ii.මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව | **6,816** | **6,907** |
| ශාඛා (ඇ) | 2,934 | **2,936** |
| දේශීය බැංකු | 2,889 | **2,895** |
| විදේශීය බැංකු | 45 | **41** |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 3,882 | **3,971** |
| iii.ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **6,439** | **6,782** |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | | |
| i.මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව | **6** | **6** |
| ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු | 1 | **1** |
| නිවාස ණය ආයතන | 2 | **2** |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 3 | **3** |
| ii.මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව | **705** | **706** |
| ශාඛා (ඇ) | 705 | **706** |
| ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු | 267 | **268** |
| නිවාස ණය ආයතන | 64 | **64** |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 374 | **374** |
| iii.ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **503** | **504** |
| **මුළු බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව** | 7,521 | 7,613 |
| **මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව** | 6,942 | 7,286 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2.4 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ තැන්පතු සංයුතිය**

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2023 | 2024 |
| ඉල්ලුම් තැන්පතු | 1,082.5 | 6.5 | **1,109.6** | **6.2** | 1.7 | **2.5** |
| ඉතුරුම් තැන්පතු | 4,292.5 | 25.8 | **4,502.6** | **25.1** | 15.8 | **4.9** |
| ස්ථාවර තැන්පතු | 11,045.8 | 66.4 | **12,155.9** | **67.6** | 6.3 | **10.1** |
| වෙනත් තැන්පතු | 209.7 | 1.3 | **201.2** | **1.1** | 58.1 | **-4.1** |
| **මුළු තැන්පතු** | 16,630.5 | 100.0 | 17,969.4 | 100.0 | 8.7 | 8.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**වගකීම්වලින් හා හිමිකම්වලින් පිළිවෙළින් 9.2%ක් සහ 5.8%ක් නියෝජනය කරන ලදී.** 2024 වසර තුළ සමස්ත තැන්පතු රුපියල් බිලියන 1,338.9කින් වර්ධනය වූ අතර, කාලීන තැන්පතු වැඩි වීම එයින් 82.9%කට දායක විය. 2024 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින්, කාලීන තැන්පතු 67.6%ක් වූ අතර, ඉතුරුම් තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු පිළිවෙළින් 25.1%ක් සහ 6.2%ක් විය. ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය, 2023 වසරේ සිට 2024 වසර දක්වා 32.3%ක සිට 31.2%ක් දක්වා සුළු වශයෙන් පහළ යන ලදී. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2023 වසරේ දී 25.3%ක සංකෝචනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 474.2කින් පහත වැටීමට සාපේක්ෂව, 2024 වසරේ දී 8.4%ක සංකෝචනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 117.4කින් පහළ යන ලදී. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් 2024 වසරේ දී විදේශ මුදල් ණය ගැනීම් එ. ජ. ඩොලර් මිලියන 281.8කින් අඩු වෙමින් 27.0%ක සංකෝචනයක් වාර්තා කිරීම අතරතුර, රුපියල් ණය ගැනීම් ද 0.2%කින් සංකෝචනය වී, එනම් රුපියල් බිලියන 2.3කින් පහත වැටීම හේතු විය.

**බැංකු අංශයේ ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණ, 2023 වසරේ දී 10.7%ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 496.0කින් වැඩි වීමට සාපේක්ෂව, 2024 වසරේ දී 3.8%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 196.6 කින් ඉහළ යන ලදී.** 2024 වසර තුළ දී භාවිත නොකළ ණය සීමා, ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය විකුණුම්, ප්‍රතිග්‍රහණ, ලේඛිත ණය සහ ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය මිලදී ගැනීම් පිළිවෙළින් රුපියල් බිලියන 107.0, රුපියල් බිලියන 83.9, රුපියල් බිලියන 43.2, රුපියල් බිලියන 30.5 සහ රුපියල් බිලියන 8.0ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඇපකර හා බැඳුම්කර රුපියල් බිලියන 84.3ක පහළ යෑමක් වාර්තා කරන ලදී.


**2.3 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය**

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2023 | 2024 |
| **වත්කම්** | | | | | | |
| ණය සහ ලැබිය යුතු දෑ | 11,020.8 | 54.0 | **11,473.7** | **51.7** | -2.6 | **4.1** |
| ආයෝජන | 7,299.9 | 35.8 | **9,083.7** | **41.0** | 23.1 | **24.4** |
| වෙනත් (ඇ) | 2,073.7 | 10.2 | **1,618.2** | **7.3** | -4.5 | **-22.0** |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | 16,630.5 | 81.5 | **17,969.4** | **81.0** | 8.7 | **8.1** |
| ණය ගැනුම් | 1,397.4 | 6.9 | **1,280.0** | **5.8** | -25.3 | **-8.4** |
| ප්‍රාග්ධන අරමුදල් | 1,765.5 | 8.7 | **2,043.2** | **9.2** | 10.5 | **15.7** |
| වෙනත් | 601.0 | 2.9 | **883.1** | **4.0** | -7.3 | **46.9** |
| **මුළු වත්කම්/වගකීම්** | 20,394.4 | 100.0 | 22,175.7 | 100.0 | 5.0 | 8.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2.1 රූප සටහන: බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2024 අවසානයට)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය[2] මගින් නිරූපණය කෙරෙන බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී අඩු වීමක් පෙන්නුම් කළ නමුත් තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.** වසර තුළ ණය ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරමින්, අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයේ පැවති 12.8%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 12.3% දක්වා සුළු වශයෙන් පහළ ගියේය. ණය ගුණාත්මකභාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 අවසානයේ සමස්ත ණය ප්‍රමාණයේ වර්ධනය සහ අක්‍රීය ණය ප්‍රමාණයේ සුළු සංකෝචනයයි. මෙයින් පෙන්නුම් කරන්නේ වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන් ණය සැපයුම සහ ආපසු ගෙවීම් කෙරෙහි ඇති කරන ධනාත්මක බලපෑමයි. තවද, අක්‍රීය ණය සඳහා වෙන්කිරීම්වල[2] 10.1%ක වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සිදු වූ වර්ධනය මගින්, 2023 වසර අවසානයේ 49.0%ක් වූ අක්‍රීය ණය සඳහා වන වෙන්කිරීම් ආවරණ අනුපාතය, 2024 වසර අවසානයේ දී 54.1% දක්වා වැඩිදියුණු විය.

**ද්‍රවශීලතා ආවරණ අනුපාත (Liquidity Coverage Ratios) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (Net Stable Funding Ratio) මගින් පෙන්නුම් කෙරෙන පරිදි බැංකු අංශයේ ද්‍රවශීලතාවය 2024 වසරේ දී වර්ධනය විය.** රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2023 වසර අවසානයේ පැවති 340.9% සිට 2024 වසර අවසානයේ දී 349.9% දක්වා ඉහළ ගිය අතර, එමගින් බැංකුවලට ඔවුන්ගේ රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් තරම් රුපියල්වලින් නාමනය කරන ලද උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (High Quality Liquid Assets) තිබූ බව පිළිබිඹු විය. රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය වැඩිදියුණු වීමට රුපියල්වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත්වල හිමිකාරීත්වය වැඩි වීම හේතුවෙන් සිදු වූ උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වල ඉහළ යෑම

2 භාවිත නොකළ ණය සීමා ඇතුළුව

**2.5 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ ලාභදායීත්වය**

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රුපියල් බිලියන) | වත්කම්වල සමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස (%) | වටිනාකම (රුපියල් බිලියන) | වත්කම්වල සමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස (%) |
| **ශුද්ධ පොලී ආදායම** | 714.6 | 3.7 | 916.0 | 4.3 |
| පොලී ආදායම | 2,610.2 | 13.4 | 2,252.0 | 10.5 |
| පොලී වියදම | 1,895.6 | 9.7 | 1,336.0 | 6.2 |
| **පොලී නොවන ආදායම** | 207.4 | 1.1 | 183.8 | 0.9 |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 132.2 | 0.7 | 147.0 | 0.7 |
| **පොලී නොවන වියදම** | 373.4 | 1.9 | 447.3 | 2.1 |
| සේවක පිරිවැය | 189.9 | 1.0 | 244.4 | 1.1 |
| ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම් | 171.6 | 0.9 | -66.5 | -0.3 |
| **බදු පෙර ලාභය (එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මූල්‍ය සේවා මත අනෙකුත් බදු සහ සංස්ථාපිත බදු අඩු කිරීමට පෙර)** | 377.0 | 1.9 | 719.0 | 3.4 |
| එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ මූල්‍ය සේවා මත අනෙකුත් බදු | 85.9 | 0.4 | 155.9 | 0.7 |
| සංස්ථාපිත බදු | 98.5 | 0.5 | 253.4 | 1.2 |
| **බදු පසු ලාභය** | 192.6 | 1.0 | 309.7 | 1.4 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් උපකාරී විය. මේ අතර, බැංකු අංශයේ සමස්ත ද්‍රවශීලතාවයේ දර්ශකයක් වන සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය ද, 2023 වසර අවසානයේ පැවති 288.4%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 313.8% දක්වා වැඩිදියුණු විය. මීට අමතරව, බැංකුවලට ප්‍රමාණවත් ලෙස ස්ථායී අරමුදල් මූලාශ්‍ර පවත්වා ගැනීමට නියම කරන ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය, 2024 වසර අවසානයේ දී අවම නියාමන අවශ්‍යතාවය වන 100.0%ට වඩා ඉහළ අගයක් වන 164.8%ක පැවතුණි.


**ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම වැඩි වීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් පෙර දී කර තිබූ ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන් වසර තුළ දී ලාභදායීතාව සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.** 2024 වසර තුළ බැංකු

**2.2 රූප සටහන: බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2.3 රූප සටහන: බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2

## විශේෂ සටහන 2
## බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ

### 1. පසුබිම

බැංකු, මූල්‍ය පද්ධතියේ අත්‍යාවශ්‍යම අංශයක් වන අතර රටේ ආර්ථික වර්ධනය හා සංවර්ධනය පවත්වා ගැනීම සඳහා අතරමැදියෙකු ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2024 වසර අග වන විට ශ්‍රී ලංකාවේ බැංකු අංශය රුපියල් ට්‍රිලියන 22 කට වැඩි වත්කම් සහිතව බලපත්‍රලාභී බැංකු 30 කින් සමන්විත විය. මෑතකාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇති වූ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා වන පියවරයන්ට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වූ මෙම උපායමාර්ගවල අරමුණ වූයේ ඇති විය හැකි අර්බුදයක් වැළැක්වීම සහ සමස්ත ආර්ථිකය වෙත බලපාන අවදානම් සහ සම්බන්ධිත බලපෑම් අවම කිරීමයි. ඒ අනුව, අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ගෙන් නිර්මාණය වූ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ බැංකු අංශය මනා ඔරොත්තු දීමේ හැකියාවකින් යුක්ත විය.

### 2. 2022 සිට මේ දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග

**අර්බුද වලට පෙර සූදානම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

අවදානම් කළමනාකරණය සඳහා වැදගත් පෙර සූදානමක් ලෙස, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට අහිතකර බලපෑම් ඇති වීම වැළැක්වීම සඳහා, තාවකාලික ද්‍රවශීලතා අර්බුදයක් ඇති බැංකු වලට හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම පිළිබඳ පවත්නා රාමුව ශක්තිමත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුද කළමනාකරණ රාමුව යටතේ කඩිනම් ප්‍රමුඛතාවයක් ලෙස මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කරමින් බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම හඳුනාගන්නා ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන වශයෙන් බැංකු සඳහා නිරාකරණ ක්‍රියාමාර්ග සහ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කරන ලදී. තවද, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල සඳහා වන පියවරයන් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය ස්ථායිතා අරමුදල ස්ථාපිත කිරීමට සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ආයතනික විධිවිධාන සහ මූල්‍ය ධාරිතාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. මීට අමතරව, අර්බුදවලට පෙර සූදානම කෙරෙහි අවධානය යොමු කිරීම සහ මූල්‍ය අර්බුදවල බලපෑම් අවම කිරීම යනාදිය සඳහා මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.



2

**බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම**

ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් බැංකු අංශය ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී සිදුකරන ලද වැදගත් මුලපිරීමක් ලෙස 2024 ජූනි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම දැක්විය හැක. නව බැංකු පනත මගින් බලපත්‍ර අවශ්‍යතා, අවසාන අර්ථලාභී හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු ඇතුළුව කොටස් හිමිකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක, ආයතනික යහපාලන අවශ්‍යතා, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එක් කිරීම සහ ඒකාබද්ධ කිරීම්, සමානුපාතිකත්වය, විශාල ගනුදෙනු නිරාවරණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, අක්වෙරළ බැංකු ව්‍යාපාර, විදේශීය බැංකු පාලිත සමාගම් බවට පත් කිරීම, ගිණුම් සහ විගණනය පිළිබඳ අවශ්‍යතා යනාදිය සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කර ඇත.

**නියාමන රාමුව ශක්තිමත් කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු වෙත නව රෙගුලාසි/ මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කරන ලදී. ඒ අනුව, විශාල ආයතනික ණය ගනුදෙනුකරුවන්ට මෙන්ම රාජ්‍ය ව්‍යවසායන්ට ණය ලබා දීම මගින් බැංකු අංශයට සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම් පිළිබඳ විධානයන් නිකුත් කරන ලදී. ගෝලීය ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව, දැඩි විචක්ෂණශීලී සීමාවන් සහ ණය ගනුදෙනුකරුවන්ගේ අන්තර් සම්බන්ධය තීරණය කිරීම සඳහා ශක්තිමත් නිර්ණායක මෙම සංශෝධිත නියාමන වලට ඇතුළත් වේ. මෙම පසුබිම තුළ, විශාල ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් ඔවුන්ගේ අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කළ යුතු වේ.

තවද, බලපත්‍රලාභී බැංකු සඳහා ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව තීරණය කරමින් හා ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. ඊට අමතරව, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර පිළිබඳ වන බැංකු පනත් විධානය සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නම් කිරීමේ බැංකු (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර කටයුතු) නියෝගය යනාදී රෙගුලාසි කිහිපයක් නිකුත් කරන ලදී. තවද, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂකවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථායෝග්‍යතාවය ඇගයීම පිළිබඳ බැංකු පනත් නිර්ණය සහ විධානය ද නිකුත් කරන ලදී. තවදුරටත්, බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් නිශ්චිතව දක්වමින් එවැනි සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සුරැකුම් සහ අදාළ සීමාවන් නිශ්චය කරමින් රෙගුලාසි නිකුත් කරන ලදී.

**වත්කම් වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනය සහ බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගය සකස් කිරීම**

බැංකු අංශය විසින් අඛණ්ඩව මුහුණ දෙන සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ, ශක්තිමත් හා ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද බලපත්‍රලාභී බැංකු පවත්වා ගැනීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශාල බැංකු නවයක් සඳහා වත්කම් වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර, එම බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව පෞද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟය පියවා ගැනීමට නොහැකි වූ බැංකු වලට අදාළව රජයේ ප්‍රතිප්‍රාග්ධනීකරණය සඳහා අදාළ ප්‍රමාණය, කාල සීමාවන්, උපකරණ සහ නියමයන් සහ කොන්දේසි ද ඇතුළත් කරමින් බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගය සකස් කරන ලදී. ඒ සඳහා 2024 අයවැයෙන් රුපියල් බිලියන 450ක අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලදී. කෙසේ නමුත්, එම අරමුදල් භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් 2024 දී මතු නොවීය. මෙම ක්‍රියාවලියේම කොටසක් ලෙස, බැංකු නවයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිප්‍රාග්ධනකරණ සැලසුම් ඉදිරිපත් කරන ලද අතර එම සැලසුම් තක්සේරු කිරීම ද අවසන් කරන ලදී. තවද, මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රගතිය ද අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

**ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම**

වර්තමාන වෙළඳපොළ වර්ධනයන්, ගෝලීය ප්‍රශස්ත භාවිතයන් සහ යාවත්කාලීන වන නියාමන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ එහි භාවිතයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. මෙම විධාන මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය දියුණු කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ නිපුණතාවය සහ වෘත්තීමය අවංකභාවය අවධාරණය කිරීම, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීම ඇතුළු අවදානම් අධීක්ෂණ හා පාලන උපක්‍රමයන් වැඩි දියුණු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම යනාදිය සඳහා මූලික වශයෙන් අවධානය යොමු කර ඇත.

2

**බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සහ සහන සැලසීමේ ක්‍රියාමාර්ග**

අහිතකර සාර්ව ආර්ථික තත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල තිරසාර ආර්ථික පුනර්ජීවනයට පහසුකම් සැලසීම සහ බලපත්‍රලාභී බැංකුවල වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 මාර්තු මාසයේදී ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. මෙම ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවල අරමුණ වන්නේ, අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් එනම් ආදායම, මුදල් ප්‍රවාහ හෝ විකුණුම්වල අඩුවීම, මෙහෙයුම් අඩුවීම හෝ අඩාල වීම හෝ තාවකාලිකව ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් මූල්‍ය සහ මෙහෙයුම් අභියෝගවලට මුහුණ දෙන හෝ ඉදිරියේදී දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි, බලපත්‍රලාභී බැංකුවල ක්‍රියාකාරී සහ අක්‍රිය ණය ගැනුම්කරුවන් හඳුනාගෙන ඔවුන්ට සහාය වීමයි. ණය පහසුකම්වලට අදාළ පරාටේ බලතල අත්හිටුවීම අවසන් වීමත් සමඟ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළව ලබා දිය හැකි සහන දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික අංශවලට අදාළ සහාය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

**3. 2025 වසරේදී සහ ඉන් ඔබ්බට කිරීමට නියමිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග**

නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සහ බැංකු පද්ධතියේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමේ අරමුණින්, 2025 සහ ඉන් ඔබ්බට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණ උපාය මාර්ගය යටතේ විශාල බැංකු නවයක් විසින් සකස් කරන ලද ප්‍රතිප්‍රාග්ධනීකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම අර්ධ වාර්ෂිකව නිරීක්ෂණය කරනු ලබන අතර, සියලුම බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණ සිදු කෙරේ. තවද, මූල්‍ය පද්ධතිය ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහිත ශක්තිමත් සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු බැංකුවලින් සමන්විත බව සහතික කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු සඳහා වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීම සඳහා වන රාමුවක් ස්ථාපිත කර, එක් එක් සිද්ධිය සලකා බලා ඒ අනුව ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. අර්බුද කළමනාකරණය සහ නිරාකරණ ක්‍රියාමාර්ග වැඩිදියුණු කරීම තුළින් මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ද ශක්තිමත් කරනු ලබන අතර, මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධීකරණය කිරීම සහ ඒ සඳහා සහාය වීම අඛණ්ඩව සිදු කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත.

විශාල ගනුදෙණු නිරාවරණයන්, ආයතනික යහපාලනය, ද්‍රවශීලතා අනුපාත, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යනාදිය ආවරණය වන පරිදි බැංකු (සංශෝධන) පනතට අනුකූලව නිකුත් කරන ලද විධාන ක්‍රියාත්මක කිරීම ද 2025 දී නිරීක්ෂණය කෙරේ. මීට අමතරව, නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම තහවුරු කිරීම සඳහා වෙළඳපොළ වර්ධනයන් සහ ගෝලීය ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව පවතින රෙගුලාසි සමාලෝචනය කෙරේ. තවද, සුපරීක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් අවදානම් පදනම් කරගත් අධීක්ෂණයෙහි ඵලදායීතාවය වැඩි කෙරෙන අතර බැංකුවල අඛණ්ඩ අධීක්ෂණය තීව්‍ර කරනු ලැබේ. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ බැංකු පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් ශක්තිමත් කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, බැංකු අංශය ශක්තිමත් මූල්‍ය තත්ත්වයකින් හා ශක්තිමත් විචක්ෂණශීලී අනුපාතවලින් යුතුව රටේ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාවක් ඇතිව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අංශයේ පොලී ආදායම 13.7%කින් පහළ ගිය නමුත්, පොලී වියදම් 29.5%කින් අඩු වීම හේතුවෙන් ශුද්ධ පොලී ආදායම 28.2%කින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසර අවසානයේ 3.7%ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2024 වසර අවසානයේ දී 4.3% දක්වා වැඩි විය. 2024 වසර තුළ දී ප්‍රධාන වශයෙන් සේවක පිරිවැය රුපියල් බිලියන 54.5කින් වැඩි වීම හේතුවෙන් පොලී නොවන වියදම් රුපියල් බිලියන 73.9කින් වැඩි වූ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා සබැඳි ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන්, ණය හානිකරණ හා අනෙකුත් අලාභ වෙන්කිරීම් රුපියල් බිලියන 238.1කින් අඩු විය. 2024 මූල්‍ය වර්ෂය සඳහා බැංකු අංශය විසින් එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මූල්‍ය සේවා සඳහා වන අනෙකුත් බදු සහ සංස්ථාපිත බදු ඇතුළුව මුළු බදු ලෙස රුපියල් බිලියන 409.3ක් ගෙවන ලද අතර, එය 2023 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 184.4ක් විය. නියාමන වාර්තාකරණයට අනුව, 2024 වසර සඳහා වන සංස්ථාපිත බදු පෙර ලාභය රුපියල් බිලියන 563.1ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 272.0ක ඉහළ යෑමකි. 2024 වසර තුළ දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රුපියල් බිලියන 309.7ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 60.8%ක වර්ධනයකි. මෙය, වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2023 වසර අවසානයේ දී වාර්තා වූ 1.5% සිට 2024 වසර අවසානය වන විට 2.6% දක්වා වැඩි වීම මගින් මෙන්ම හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2023 වසරේ දී පැවති 11.5% සිට 2024 වසරේ දී 15.6% දක්වා

**2.6 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය**

| අයිතමය | රුපියල් බිලියන | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2023 (අ) | 2024 (ආ) | 2023 (අ) | 2024 (ආ) |
| **ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන** | 1,395.1 | 1,455.5 | 100.0 | 100.0 |
| කොටස් ප්‍රාග්ධනය | 385.8 | **416.1** | 27.7 | **28.6** |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 87.7 | **88.7** | 6.3 | **6.1** |
| නොබෙදූ ලාභ | 720.0 | **710.5** | 51.6 | **48.8** |
| පොදු හා අනෙකුත් සංචිත | 332.3 | **330.4** | 23.8 | **22.7** |
| වෙනත් | 93.1 | **70.8** | 6.7 | **4.9** |
| නියාමක ගැලපීම් | -223.8 | **-161.0** | -16.0 | **-11.0** |
| **දෙවන ස්ථරය : ප්‍රාග්ධන** | 291.9 | 345.4 | 100.0 | 100.0 |
| ප්‍රත්‍යාගණන සංචිත | 44.1 | **52.6** | 15.1 | **15.2** |
| උපකාරක ණය | 147.9 | **196.8** | 50.7 | **57.0** |
| පොදු වෙන්කිරීම් සහ වෙනත් | 100.5 | **97.4** | 34.4 | **28.2** |
| නියාමක ගැලපීම් | -0.6 | **-1.5** | -0.2 | **-0.4** |
| **සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම** | 1,687.0 | 1,800.9 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩි වීම මගින් ද පිළිබිඹු විය. තවද, ප්‍රධාන වශයෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ කාර්යක්ෂමතාවය 2023 වසර අවසානයේ දී පැවති 40.5% සිට 2024 වසර අවසානයේ දී 40.7% දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක්විය.

**2024 වසර තුළ දී, බැංකු අංශය සමස්තයක් වශයෙන් ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල විය.** අභියෝගාත්මක ව්‍යාපාරික තත්ත්වයන් මගින් පැන නැගිය හැකි අවදානම් හේතුවෙන් සිදුවිය හැකි අලාභ අවශෝෂණය කර ගැනීමට සහ බැංකු අංශයේ ශක්තිමත්භාවය වර්ධනය කරගැනීම උදෙසා, උසස් තත්ත්වයේ ප්‍රාග්ධනය එක්රැස් කිරීමට බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු විසින් 2024 වසර තුළ දී කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 30.3කින් වැඩි කිරීම හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ඉහළ නංවාගෙන ඇත. වසර තුළ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය 6.8%ක වර්ධනයක් වාර්තා කළ අතර, එම වර්ධනයෙන් 53.0%ක වැඩි වීමට පළමු ස්ථර ප්‍රාග්ධනය දායකත්වය දැක්වීය. තවද, විගණනය කරන ලද ලාභ රඳවා තබා ගැනීමත් සමඟ වසර අවසාන ප්‍රාග්ධන අගයන් තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇත. මේ අතර, 2024 වසර අවසානයේ සමස්ත ප්‍රාග්ධන අනුපාතය 18.4%ක් ලෙස පැවති අතර, පළමු ස්ථර ප්‍රාග්ධන අනුපාතය 2023 වසර අවසානයේ පැවති 15.2%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 14.9% දක්වා සුළු වශයෙන් අඩු විය.

## 2.2 බැංකු නොවන මූල්‍ය ආයතන අංශය


### මුදල් සමාගම්

**මුදල් සමාගම් අංශය 2024 වසර තුළ දී සැලකිය යුතු ප්‍රසාරණයක් වාර්තා කළ අතර, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් පවත්වා ගනිමින් ශක්තිමත්ව පැවතුණි.** මෙම අංශය ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ ණය ගැනීම් අනුව වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, අක්‍රීය ණය හෙවත් තෙවන අදියර යටතේ වර්ගීකරණය කරන ලද ණය අඩුවීමෙන් පිළිබිඹු වන පරිදි මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු විය. 2024 වසර අවසානය වන විට, මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 5.4%ක් නියෝජනය කළ මෙම අංශය, මුදල් සමාගම් 32කින්[3] සමන්විත විය. මුදල් සමාගම්වල ශාඛා 1,908ක් තිබූ අතර, ඉන් ශාඛා 1,265ක් බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබීමෙන් මෙම සමාගම් බොහෝ අංශවල මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් මූල්‍ය අන්තර්ගතභාවය සඳහා පහසුකම් සපයන ලද බව තහවුරු වේ. මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව වඩාත් ශක්තිමත් මුදල් සමාගම් අංශයක් ඇති කිරීමේ අරමුණින් මුදල් සමාගම් අංශයේ ඒකාබද්ධ කිරීම සඳහා වූ සැලැස්මේ දෙවන අදියර සඳහා සංශෝධිත රාමුව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී හඳුන්වාදුන් අතර, මෙම සංශෝධිත රාමුව වසර තුනක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහිතව 2025 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වේ[4].

**මෙම අංශයේ වත්කම් පදනම 2023 වසර අවසානයේ දී පැවති 5.7%ක වර්ධනයට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 13.9%කින්, එනම් රුපියල් බිලියන 235.2කින් වර්ධනය වී රුපියල් බිලියන 1,930.7ක් දක්වා ඉහළ ගියේය.** වත්කම් පදනමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි සිදු වූ සැලකිය යුතු ප්‍රසාරණයයි. ශුද්ධ ණය සහ අත්තිකාරම් මුදල් සමාගම් අංශයේ මුළු වත්කම්වලින් 74.1%කට හිමිකම් කීවේය. 2024 වසර තුළ මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ රුපියල් බිලියන 1,430.2ක් දක්වා

3 ETI ෆිනෑන්ස් ලිමිටඩ් හැර (කොළඹ වාණිජ මහාධිකරණය 2023 දෙසැම්බර් 15 වන දින අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ETI ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ඈවර කිරීම සඳහා නියෝග කළේය).
4 ඒකාබද්ධකරණ සැලැස්ම ක්‍රියාත්මක වීමත් සමඟ, 2024 වසර අවසානය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ මෙහෙයුම් කටයුතුවල නිරත වූයේ එක් සමාගමක් පමණි.

**2.4 රූප සටහන: මුදල් සමාගම් අංශයේ සමස්ත ණය සහ අත්තිකාරම් (ශුද්ධ) - ණය කාණ්ඩ අනුව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් බිලියන 265.4කින් ඉහළ ගිය අතර, එය 2023 වසරේ දී 2.6%ක සංකෝචනය වීමකට සාපේක්ෂව 2024 වසර අවසානයේ 22.8%ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2023 වසර අවසානය දී මුළු ණය සහ අත්තිකාරම්වලින් 66.2%ක් ලෙස වාර්තා වූ මූල්‍ය කල්බදු හා වාහන ණය, 2024 වසර අවසානය වන විට මුළු ණය සහ අත්තිකාරම්වලින් 64.0%ක් ලෙස වාර්තා කරමින් මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි ප්‍රමුඛස්ථානය ලබාගත් අතර, 2023 වසර අවසානයේ දී මුළු ණය සහ අත්තිකාරම්වලින් 18.7%ක් ලෙස වාර්තා වූ රන් සුරැකුම් මත ණය දීම්, 2024 වසර අවසානය වන විට මුළු ණය සහ අත්තිකාරම්වලින් 19.8%ක් ලෙස වාර්තා වී ඇත. මූල්‍ය කල්බදු හා වාහන ණය සහ රන් සුරැකුම් මත ණය දීම් 2024 වසර අවසානයේ දී පිළිවෙළින් 18.7%ක් සහ 30.4%ක වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල ආයෝජන අඩු වීම හේතු කොටගෙන, ක්‍රමක්ෂය කළ පිරිවැය මත මනිනු ලබන ණය ගැනීම් සහ අනෙකුත් මූල්‍ය උපකරණ මගින් පිළිබිඹු වන මූල්‍ය වත්කම්, 2023 වසරේ දී පැවති 71.1%ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී 39.9%කින් සංකෝචනය විය.

**දළ අක්‍රීය ණය අනුපාතය 2023 වසර අවසානයේ පෙන්නුම් කළ 18.0%ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී 11.3% දක්වා පහළ යාමෙන් පිළිබිඹු වන පරිදි, මුදල් සමාගම් අංශයේ ණයවල ගුණාත්මකභාවය ඉහළ ගොස් ඇත.** මේ අතර, මෙම අංශයේ අක්‍රීය ණය සඳහා වන හානිකරණ ආවරණ අනුපාතය 2023 වසර අවසානයේ වාර්තා වූ 32.6%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 41.9%ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2023 වසර අවසානය වන විට 12.1%ක් ලෙස වාර්තා වූ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය 2024 වසර අවසානය වන විට 6.6%ක් ලෙස යහපත් මට්ටමකට අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

**මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතාවය, 2024 වසර තුළ දී අවම නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකි විය.** 2024 වසර අවසානයේ දී අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය වූ රුපියල් බිලියන 115.8ට එරෙහිව එම වසරේ දී මෙම අංශය සතුව පැවති සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 220.9ක් වූ අතර, 2023 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 151.5ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2024 වසර අවසානයේ රුපියල් බිලියන 105.1ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරන ලදී. 2024 වසර අවසන් වන විට මුදල් සමාගම් අංශයේ මුළු වගකීම්වලින් 54.7%ක් වූ පාරිභෝගික තැන්පතු තවදුරටත් වගකීම්වලින් ප්‍රමුඛත්වය ගත් අතර, හිමිකම් සහ ණය ගැනීම් මුළු වගකීම්වලින් පිළිවෙළින් 24.3%ක් සහ 15.8%ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී තැන්පතු රුපියල් බිලියන 1,056.4ක් දක්වා 13.0%කින්, එනම් රුපියල් බිලියන 121.4කින් වර්ධනය විය. මේ අතර, 2024 වසර තුළ දී ණය ගැනීම් රුපියල් බිලියන 305.4ක් දක්වා 15.3%කින්, එනම් රුපියල් බිලියන 40.5කින් වර්ධනය විය.

**ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ බදු පසු ලාභය, 2023 වසරේ පැවති රුපියල් බිලියන 49.4 සිට 2024 වසරේ දී රුපියල් බිලියන 59.7 දක්වා 20.9%කින් ඉහළ ගියේය.** 2024 වසර තුළ රුපියල් බිලියන 191.8ක් ලෙස වාර්තා වූ ශුද්ධ පොලී ආදායම ප්‍රධාන වශයෙන් මෙම අංශයේ ඉහළ ලාභදායීත්වයට දායක වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 24.3%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. තවද, පොලී නොවන ආදායම 2024 වසර තුළ දී රුපියල් බිලියන 33.8ක් වූ අතර, 2023 වසරට සාපේක්ෂව 1.4%ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. 2023 වසරේ දී පිළිවෙළින් 5.2%ක් සහ 12.7%ක් වූ වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත, 2024 වසරේ දී පිළිවෙළින් 6.1% සහ 13.5% දක්වා ඉහළ යාමෙන් ලාභදායීත්වයේ වැඩි වීම පිළිබිඹු විය. 2023 වසරේ දී 52.8%ක් ව පැවති කාර්යක්ෂමතා අනුපාතය 2024 වසරේ දී 50.8% දක්වා පහත වැටීමෙන් පිළිබිඹු වන පරිදි මෙම අංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු විය.

**මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන පදනම 2023 වසර අවසානයේ දී රුපියල් බිලියන 329.1 සිට 2024 වසර අවසානයේ රුපියල් බිලියන 357.4 දක්වා රුපියල් බිලියන 28.3කින් වර්ධනය වූ අතර එය වසර තුළ 8.6%ක වර්ධනයක් වාර්තා කළේය.** මුදල් සමාගම් දෙකක්[5] හැර අනෙකුත් සියලුම සමාගම් අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල විය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත 2023 වසර අවසානය වන විට පිළිවෙළින් 21.1%ක් සහ 22.3%ක් ලෙස වාර්තා වීමට සාපේක්ෂව, 2024 වසර අවසානය වන විට පිළිවෙළින් 20.4%ක් සහ 21.2%ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණු නමුත් අවම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

## ප්‍රාථමික අලෙවිකාර සමාගම්

**2024 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සක්‍රීය ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස ලියාපදිංචි වූ බලපත්‍රලාභී වාණිජ බැංකු පහක්[6] සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් පහක්[7] කටයුතු කළහ.** ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත වත්කම් 2023 වසර

5 2024 වසර අවසානය වන විට එම සමාගම්, මුදල් සමාගම් අංශයේ වත්කම්වලින් 0.7%ක් නියෝජනය කළේය. අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවූ මුදල් සමාගම්වල තැන්පතු මත උපරිම සීමා, ණයදීම් මත උපරිම සීමා, නව තැන්පතු භාර ගැනීම අත්හිටුවීම, සහ නව ණය ලබාදීම මත උපරිම සීමා වැනි නියාමන සීමාකිරීම් පනවා ඇත.

6 පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් හැර (රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම 2017 අගෝස්තු 15 දින සිට අත්හිටුවන ලදී).

7 එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. (2017 ජුලි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවීමට එන්ට්‍රස්ට් සිකියුරිටීස් පී.එල්.සී. වෙත නියෝග කර ඇත. අනාරක්ෂිත ආයෝජකයෙකු විසින් මෙම සමාගම ස්වේච්ඡාවෙන් ණයහිමියන්ගේ ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මගින් 2022 ජූනි 17 දින ගණන් බේරා වසා දැමීම සඳහා වන නියෝගය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගණන් බේරා වසා දැමීම සඳහා ගොනු කල නඩුව වෙනත් නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් තවමත් විභාග වෙමින් පවතී) සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම (2017 ජුලි 06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2025 ජනවාරි 05 දින සිට බලපැවැත්වෙන පරිදි තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී) යන ආයතන හැර.

2

තුළ දී පැවති රුපියල් බිලියන 270.9ට සාපේක්ෂව 2024 වසර තුළ දී රුපියල් බිලියන 297.2ක් දක්වා 9.7%කින් වර්ධනය වී ඇත. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කර ඇති සමස්ත ආයෝජන කළඹ 2024 වසර අවසන් වන විට රුපියල් බිලියන 277.9ක් වූ අතර, එය 2023 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 262.9ට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 5.7%ක වර්ධනයක් වාර්තා කළේය.

**2024 වසර තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් රුපියල් බිලියන 9.7ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර, එය 2023 වසර තුළ දී වාර්තා කළ බදු පසු ලාභය වන රුපියල් බිලියන 30.4 සිට සැලකිය යුතු පහත වැටීමක් පෙන්නුම් කරයි.** ලාභදායීතාවයේ මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් පොලී ආදායම සහ ප්‍රාග්ධන ලාභ අඩු වීම මෙන්ම ලාභය සහ අලාභය හරහා සාධාරණ වටිනාකම මත මනිනු ලබන වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්වල නැවත තක්සේරු පාඩු ඉහළ යෑම ද බලපාන ලදී. තවද, ප්‍රාථමික අලෙවිකාර සමාගම්හි වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත 2023 වසරේ දී පිළිවෙළින් 31.9% සහ 113.9% සිට 2024 වසරේ දී පිළිවෙළින් 7.9% සහ 30.9% දක්වා අඩු විය.

**ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල කොටස් හිමිකම 2.3%ක් තරම් වූ සුළු අගයකින් අඩු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ලාභයේ පහත වැටීම හේතු විය.** ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය 2023 වසර අවසානයේ දී වාර්තා වූ 22.3% සිට 2024 වසර අවසානයේ දී 18.7%ක් දක්වා පහළ යෑමක් වාර්තා කළ ද, එහි අවම අවශ්‍යතාව වන 10.0%ට වඩා වැඩි අගයක පැවතුණි.

**භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙන්දේසිය සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහභාගීත්වය 2024 වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පිළිබිඹු කරන ලදී.** 2024 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු (වටිනාකම අනුව) 25.4%කින් රුපියල් බිලියන 18,639.9ක් දක්වා පහත වැටුණු අතර, එයින් 72.9%ක් ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු විය. 2023 වසර සමඟ සැසඳීමේ දී 2024 වසර තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල එකවර මිලදී ගැනුම් 28.8%කින් පහළ ගිය අතර, එකවර විකුණුම් 11.3%කින් අඩු විය.

## බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

**සමාගම් හතරකින් සමන්විත වන බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් අංශය 27.0%ක වර්ධනයක් සමඟින් 2024 වසර අවසානයේ දී වාර්තා කළ මුළු වත්කම් පදනම රුපියල් බිලියන 14.8ක් විය.** ක්ෂුද්‍ර මූල්‍ය ණය හා අත්තිකාරම්, සමස්ත වත්කම් ප්‍රමාණයෙන් විශාලතම දායකත්වය දැක්වූ අතර, එය 2023 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 7.6ට සාපේක්ෂව 49.9%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2024 වසර අවසානයේ දී රුපියල් බිලියන 11.4ක් ලෙස වාර්තා විය. මෙම අංශයේ සමස්ත තැන්පතු පදනම, 2023 වසරේ පැවති රුපියල් මිලියන 828.9ක අගයෙහි සිට 2024 වසරේ දී රුපියල් මිලියන 1,124.4ක් දක්වා 35.7%කින් වර්ධනය විය. 2024 වසර අවසානයේ දී මෙම අංශයේ මූලික ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 3.3ක් ලෙස සටහන් වූ අතර, සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මූලික ප්‍රාග්ධනය සඳහා වන අවම විචක්ෂණශීලී රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය.

## ඒකක භාර

**වත්කම් පදනමේ සැලකිය යුතු වැඩි වීමක් සමඟ ඒකක භාර අංශය 2024 වසර තුළ දී ද අඛණ්ඩව වර්ධනය විය.** ක්‍රියාත්මකව පවතින ඒකක භාර සංඛ්‍යාව 2023 වසර අවසානයේ වාර්තා වූ 84 සිට 2024 වසර අවසාන වන විට 90 දක්වා ඉහළ ගිය අතර, ඒකක භාර කළමනාකරණ සමාගම් සංඛ්‍යාව 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 16ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, නිකුත් කරන ලද ඒකක සංඛ්‍යාව 2023 වසර අවසානයේ වාර්තා වූ මිලියන 13,371ට සාපේක්ෂව 2024 වසර අවසානයේ මිලියන 30,260 දක්වා 126.3%කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. තවද, 2023 වසර අවසානයේ 93,450ක් වශයෙන් වාර්තා වූ සමස්ත ඒකක හිමියන් සංඛ්‍යාව 2024 වසර අවසානයේ දී 114,898ක් දක්වා වර්ධනය විය. 2023 වසර අවසානයේ රුපියල් බිලියන 406.5ක් ලෙස පැවති ඒකක භාරයන්හි මුළු වත්කම්, 2024 වසර අවසානයේ රුපියල් බිලියන 547.4ක් දක්වා 34.7%කින් වර්ධනය විය. ඒකක භාර අරමුදල් ප්‍රධාන වශයෙන් මුදල් වෙළඳපොළ අරමුදල් සහ ආදායම් අරමුදල්වලින් සමන්විත වූ අතර, එමගින් 2024 වසර අවසානය වන විට ඒකක භාර අංශයේ 83.9%ක් ඒකාබද්ධව නියෝජනය විය. මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ඒකක භාර මගින් රාජ්‍ය සුරැකුම්පත්වල සිදුකරන ලද ආයෝජන 2023 වසර අවසානයේ වාර්තා වූ 77.2% සිට 2024 වසර අවසානයේ දී 67.8% දක්වා පහළ ගියේය. මීට අමතරව, ඒකක භාර වත්කම්වල ප්‍රතිශතයක් ලෙස කොටස් ආයෝජනය 2023 වසර අවසානයේ පැවති 4.5%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 5.7%ක් දක්වා ඉහළ ගියේය.

## රක්ෂණ අංශය[8]

**දිගු කාලීන සහ සාමාන්‍ය යන උප අංශවලින් සමන්විත රක්ෂණ අංශයේ සමස්ත වත්කම් ප්‍රසාරණය වූ නමුත්, 2024 වසර තුළ දී එම අංශය මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය.**

8 මෙම පරිච්ඡේදය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සලකා බලා නොමැත.

2024 වසර අවසන් වන විට රක්ෂණ අංශයේ මෙහෙයුම් කටයුතුවල නිරත වන සමාගම් අතරින් 15ක් දිගු කාලීන රක්ෂණ සමාගම් ලෙස ද, සමාගම් 14ක් සාමාන්‍ය රක්ෂණ සමාගම් ලෙස ද ක්‍රියාත්මක විය. මීට අමතරව, 2024 වසර අවසන් වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් 81ක් ක්‍රියාත්මක විය.

**2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී රක්ෂණ අංශයේ දළ ලියාපදිංචි වාරිකයෙහි (Gross Written Premium) වර්ධනය වීමක් වාර්තා විය.** වසර තුළ දී, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල දළ ලියාපදිංචි වාරික වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙළින් 20.4%කින් සහ 11.7%කින් වර්ධනය විය. මේ අතර, 2024 වසර අවසානය වන විට දිගු කාලීන උප අංශයේ වත්කම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.7%කින් වර්ධනය වූ අතර, සාමාන්‍ය රක්ෂණයේ වත්කම් 5.3%කින් පහත වැටුණි. කෙසේ වෙතත්, දිගු කාලීන රක්ෂණ උප අංශයේ ඉහළ වත්කම් පදනම හේතුවෙන්, 2024 වසර තුළ සමස්ත රක්ෂණ අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.9%කින් වර්ධනය විය.

**දිගු කාලීන රක්ෂණ උප අංශයේ බදු පෙර ලාභය 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී 6.2%කින් වර්ධනය වූ අතර, මෙම කාලසීමාව තුළ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ බදු පෙර ලාභය 2.4%කින් පහළ ගියේය.** 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන උප අංශ දෙකෙහිම වත්කම් මත ප්‍රතිලාභ අනුපාත පිරිහී ඇත. තවද, 2024 වසර අවසානයේ දී දිගු කාලීන සහ සාමාන්‍ය යන රක්ෂණ උප අංශවල ගෙවන ලද හිමිකම් ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව පිළිවෙළින් 9.4%කින් සහ 2.2%කින් වැඩි විය.

**2024 වසර තුළ දී, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන තත්ත්වය වැඩිදියුණු වූ අතර, දිගු කාලීන රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන තත්ත්වයෙහි පහත වැටීමක් දක්නට ලැබුණ ද, එය අවම අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් පැවතුණි.** ඒ අනුව, සාමාන්‍ය රක්ෂණය සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පෙර වසර අවසානයේ පැවති 252.0% සිට 2024 වසර අවසානයේ දී 322.0% දක්වා ඉහළ ගියේය. දිගු කාලීන රක්ෂණය සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වසරකට පෙර පැවති 358.3% සිට 2024 වසර අවසානයේ 338.1% දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල ප්‍රාග්ධනයට මුළු වත්කම් අනුපාතය 2023 වසර අවසානයේ වාර්තා වූ පිළිවෙළින් 0.22 සහ 0.51ට සාපේක්ෂව 2024 වසර අවසානයේ පිළිවෙළින් 0.19 සහ 0.44 දක්වා අඩු විය.

## සේවක අර්ථසාධක අරමුදල

**2024 වසර අවසානයේ දී විශ්‍රාම අරමුදල් අංශයේ සමස්ත වත්කම්වලින් 81.0%කට හිමිකම් කියමින් සේවක අර්ථසාධක අරමුදල තවදුරටත් එම අංශයෙහි ප්‍රධානත්වය දැරුවේය.** සේවක අර්ථසාධක අරමුදලෙහි ශුද්ධ වටිනාකම

**2.7 සංඛ්‍යා සටහන: සේවක අර්ථසාධක අරමුදලෙහි කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය**

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 (අ) |
|---|---|---|---|---|---|
| අරමුදලේ ශුද්ධ වටිනාකම (රුපියල් බිලියන) | 2,824.3 | 3,166.1 | 3,459.9 | 3,886.7 | **4,375.7** |
| සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (රුපියල් බිලියන) | 2,767.8 | 3,066.9 | 3,380.6 | 3,817.9 | **4,289.5** |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 150.7 | 165.7 | 194.6 | 210.6 | **234.4** |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 109.7 | 118.2 | 163.0 | 215.9 | **188.1** |
| ශුද්ධ දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 41.0 | 47.5 | 31.6 | -5.3 | **46.3** |
| සාමාජික ශේෂ මත පොලී අනුපාතිකය (%) | 9.00 | 9.00 | 9.00 | 13.00 | **11.00** |
| මුළු සාමාජික ගිණුම් ගණන (මිලියන) | 19.8 | 20.3 | 20.4 | 21.5 | **21.5** |
| දායක මුදල් ගෙවමින් පවතින සාමාජික ගිණුම් ගණන (මිලියන) | 2.6 | 2.5 | 2.7 | 2.6 | **2.6** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2023 වසර අවසානයේ දී වාර්තා කළ රුපියල් බිලියන 3,886.7ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 4,375.7 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.6%කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2024 වසර තුළ දී, අරමුදල ආයෝජන කිරීම තුළින් උපයන ලද  ආදායම සහ ශුද්ධ දායක මුදල් ලැබීම් මෙම වර්ධනය සඳහා හේතු විය. ඊට සමගාමීව, මෙම කාලය තුළ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම ද 12.4%කින් වැඩි විය. මේ අතර, 2024 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 234.4ක් දක්වා 11.3%කින් ඉහළ ගිය අතර, සාමාජිකයින්ට සහ ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට ගෙවන ලද සමස්ත ප්‍රතිලාභ ප්‍රමාණය රුපියල් බිලියන 188.1 දක්වා 12.9% කින් අඩු විය. 2023 වසරේ දී රුපියල් බිලියන 5.3ක ඍණ අගයක් ලෙස වාර්තා වූ අරමුදලෙහි ශුද්ධ දායක මුදල් ලැබීමට සාපේක්ෂව එම අගය 2024 වසරේ දී රුපියල් බිලියන 46.3ක ධන අගයක් ලෙස වාර්තා විය.

**2024 වසර තුළ අරමුදලේ සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 513.8ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 481.1 හා සැසඳීමේ දී 6.8%ක කැපී පෙනෙන වර්ධනයකි.** පොලී ආදායම, අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, එය 2023 වසරේ දී උපයන ලද රුපියල් බිලියන 442.4ට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 455.1 දක්වා 2.9%කින් වර්ධනය විය. 2023 වසරේ දී රුපියල් බිලියන 3.0ක් වූ ලාභාංශ ආදායම 2024 වසරේ දී රුපියල් බිලියන 5.5ක් දක්වා 82.9%කින් ඉහළ ගියේය. 2023 වසරේ දී රුපියල් බිලියන 23.8ක් ලෙස වාර්තා වූ සාධාරණ අගයට (fair value) ඇති ලැයිස්තුගත කොටස් ආයෝජනවල ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2024 වසර සඳහා එම ලාභය රුපියල් බිලියන 49.2ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලෙහි දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය 0.6%ක මට්ටමක පවත්වා ගෙන යන ලදී. එසේ වුව ද, ආයෝජන ආදායම වැඩි වීම හේතුවෙන් 2024 වසරේ දී අරමුදලේ බදු වියදම ද රුපියල් බිලියන 64.1ක් දක්වා ඉහළ ගියේය. මුදල් හා කම්කරු විෂයන් භාර අමාත්‍යවරුන්ගේ

ඒකඟත්වය ලැබීමට යටත්ව, 2024 වසර සඳහා සාමාජික ශේෂයන් මත 11.00%ක පොලී අනුපාතයක් මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇත.

### සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

**2024 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ වත්කම් පදනම රුපියල් බිලියන 591.3ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.7%කින් වර්ධනය විය.** සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් කරන ලද ආයෝජන රුපියල් බිලියන 581.1ක් දක්වා 12.8%කින් ඉහළ ගියේය. මෙම ආයෝජනවලින් 94.7%ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර, එය 2024 වසර අවසන් වන විට රුපියල් බිලියන 550.5ක් දක්වා 14.7%කින් වර්ධනය විය. මෙම අරමුදල, 2024 වසරේ දී එහි සාමාජික ශේෂයන් සඳහා 11.9%ක ආයෝජන මත ප්‍රතිලාභ උපයා ගැනීමට සමත් විය. අරමුදලේ සාමාජික ගිණුම් මිලියන 16.3න් 2024 අවසානය වන විට ගිණුම් මිලියන 2.3ක් සක්‍රීයව පැවතුණි. අරමුදලට දායක වන සේවා යෝජකයන්ගේ සංඛ්‍යාව 2023 වසර අවසානයේ 74,927ක් වූ අතර, එය 2024 වසර අවසන් වන විට 80,008ක් දක්වා වර්ධනය විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලහි මුළු සාමාජික ශේෂය 11.9%කින් වැඩි වී 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 564.3ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලේ මුළු දායකත්ව මුදල් රුපියල් බිලියන 42.0ක් දක්වා 12.9%කින් වර්ධනය වූ අතර, සාමාජිකයින්ට ගෙවන ලද මුළු විශ්‍රාම ප්‍රතිලාභ රුපියල් බිලියන 33.4ක් දක්වා 12.7%කින් අඩු විය.

### අනෙකුත් විශ්‍රාම අරමුදල්

**විශ්‍රාම අරමුදල් අංශයෙන් 1.9%ක් නියෝජනය කරනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 2024 වසර අවසානයේ දී වත්කම් සහ ආයෝජන පදනම අනුව ප්‍රසාරණයක් පෙන්නුම් කළේය.** අරමුදලේ මුළු වත්කම්, 2024 වසර අවසානයේ දී රුපියල් බිලියන 105.0ක් දක්වා 9.6%කින් වර්ධනය විය. 2023 වසර අවසානයේ වාර්තා වූ 272,630ක් වූ අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එම සංඛ්‍යාව 272,575ක් විය. මේ අතර, 2024 වසර අවසානයේ දී, මෙම අරමුදලේ මුළු ආයෝජන රුපියල් බිලියන 113.4ක් දක්වා 10.7%ක වර්ධනයක් වාර්තා කළේය. 2024 වසර අවසන් වන විට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල එහි මුළු ආයෝජනවලින් 41.7%ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අතර, අනෙකුත් ආයෝජන එහි මුළු ආයෝජනවලින් 58.3%ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලේ සාමාජික ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය 10.00%ක් විය.

**අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් 2024 වසර අවසානය වන විට විශ්‍රාම අරමුදල් අංශයෙන් 6.2%ක් නියෝජනය කළේය.** මෙම අරමුදල් මගින් ආවරණය වන ඇස්තමේන්තුගත සාමාජිකයින් සංඛ්‍යාව 2024 වසර අවසන් වන විට 108,651ක් විය. මීට අමතරව, 2024 වසර අවසානය වන විට අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 339.2ක් දක්වා වැඩි වූ අතර, එම කාලය අවසානයේ අරමුදලේ මුළු ආයෝජන ප්‍රමාණය ද රුපියල් බිලියන 263.9ක් දක්වා වර්ධනය විය.

## 2.3 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය


### දේශීය මුදල් වෙළඳපොළ ප්‍රවණතා

**2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය වර්ධනය විය.** ඇතැම් දේශීය පුද්ගලික බැංකු වරින් වර ද්‍රවශීලතා හිඟයන් අත්දැකීමත්, රාජ්‍ය බැංකු සහ බොහෝ විදේශීය බැංකු සැලකිය යුතු ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කිරීමත් සමඟ, 2024 වසරේ දී ද බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතාවයෙහි අසමමිතික ව්‍යාප්තියක් නිරීක්ෂණය විය. ද්‍රවශීලතාවයේ මෙම අසමමිතික ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන, විවට වෙළඳපොළ කටයුතු හරහා දේශීය මුදල් වෙළඳපොළට මහ බැංකුව අඛණ්ඩව මැදිහත්වීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, විශේෂයෙන්ම 2024 වසරේ අග භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමඟ, මහ බැංකුව සිය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූලව සීමා කරන ලද අතර අවශ්‍යතාව අනුව පමණක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දීම, පදනම් අංක 50කින් පමණ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීම සහ මනා ලෙස හසුරුවන ලද විවට වෙළඳපොළ කටයුතු හේතුවෙන්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 8.55%ක මට්ටමේ සිට, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුරූපව 8.00%ක් දක්වා ළඟා විය. එමෙන්ම, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට සමාන හැසිරීමක් බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයේ ද පෙන්නුම් කරන ලද අතර, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එය 8.11%ක් ලෙස වාර්තා විය.

### දේශීය විදේශ විනිමය වෙළඳපොළ

**මහ බැංකුව විසින් වසර පුරා විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදුකරන ලද කාලෝචිත මැදිහත්වීම්, වෙළඳපොළ තුළ ඇති විය හැකි අධික විචලන සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීමට සමත් විය.** මෙම උපායමාර්ගය හේතුවෙන් විනිමය අනුපාතිකයේ අවම විචලනයන් පමණක් සහිතව දළ නිල විදේශ සංචිත ගොඩනැගීමට මහ බැංකුවට හැකි විය. 2024 වසර තුළ දී, මහ බැංකුව එ. ජ. ඩොලර් මිලියන 3,028.6ක් අවශෝෂණය කර ගත් අතර, වෙළඳපොළට එ. ජ. ඩොලර් මිලියන 183.0ක් සපයන ලදී.

**2.5 රූප සටහන: 2024 වසරේ විවට වෙළඳපොළ කටයුතු, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම**




*ද්‍රවශීලතාව සැපයීමට අදාළ සාධක සෘණ අගයන් ලෙස දක්වා ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ මුල් භාගයේ දී මහ බැංකුව විසින් විදේශ විනිමය අනුපාතිකයේ දෛනික විචලනය අඩු කිරීමට සහ එමගින් ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අතිප්‍රමාණය වීමේ පීඩනය අඩු කිරීම සඳහා වෙළඳපොළ වෙතින් විශාල ලෙස විදේශ විනිමය මිලදී ගැනීම් සිදු කරන ලදී. 2024 වසර අවසානය වන විට, වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම් එ. ජ. ඩොලර් මිලියන 2,845.6ක් ලෙස වාර්තා වූ අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉක්මවා යමින්, මහ බැංකුව මෙතෙක් සිදු කළ විශාලතම වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම ලෙස සනිටුහන් විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවය ස්ථාවරව පැවතුණි. තවද, 2023 වසරේ දී වාර්තා වූ එ. ජ. ඩොලර් බිලියන 15.0ට සාපේක්ෂව 2024 වසරේ දී දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළෙඳපොළෙහි වෙළඳ පරිමාවන් එ. ජ. ඩොලර් බිලියන 16.3ක් දක්වා 9.0%කින් වර්ධනය විය.

## රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

**ඇතැම් කාලපරිච්ඡේදවල දක්නට ලැබුණු කඩින් කඩ ඉහළ යෑම් හැරුණු විට, 2024 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික වෙළඳපොළෙහි ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී.** ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, පහළ ගිය උද්ධමන අපේක්ෂා, පුළුල් රාජ්‍ය මූල්‍ය විනය සමග ක්‍රියාත්මක කළ මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම වැනි ක්‍රියාමාර්ග සහ අවදානම් අධිමිල (risk premia) ක්‍රමයෙන් අඩු වීම, ඵලදා අනුපාතිකවල සැලකිය යුතු පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්ගේ වර්ධනය වීම සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා පැවති තිරසර ඉල්ලුම ද, ඵලදා අනුපාතිකවල පහළ යෑමේ ප්‍රවණතාවයට දායක විය. 2024 ජූලි සිට 2024 සැප්තැම්බර් දක්වා කෙටි කාලය තුළ ඵලදා අනුපාතිකවල යම් ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, පැවැති දේශපාලන අවිනිශ්චිතතා ජනාධිපතිවරණයෙන් පසුව අඩු වීමත් සමග රාජ්‍ය සුරැකුම්පත් සඳහා ඉල්ලුම තවදුරටත් තීව්‍ර වූ අතර, එය ද ඵලදා අනුපාතික පහළ යෑමට දායක විය. ඒ අනුව, 2024 වසර තුළ දී, දින-91, දින-182 සහ දින-364 භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රාථමික වෙළඳපොළෙහි ඵලදා අනුපාතික පිළිවෙළින් පදනම් අංක 589, 539 සහ 397කින් පහළ යන ලදී.

**ප්‍රාථමික වෙළඳපොළෙහි මෙම ප්‍රවණතාවන්ට සමගාමීව, 2024 වසර තුළ සියලු කල්පිරීම්වලට අදාළව ද්විතීයික වෙළඳපොළෙහි රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ද පහළ ගියේය.** මීට අමතරව, වසර තුළ දී ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය සාමාන්‍ය හැඩැති වක්‍රයක් බවට පත් විය. කෙසේ වෙතත්, කෙටි කාලීන කල්පිරීම්වල ඵලදා අනුපාතික දිගු කාලීන ඵලදා අනුපාතිකවලට වඩා වැඩි වශයෙන් පහළ යෑම, ඉහළ පදනම් වාරික (term premia) සඳහා හේතු විය. දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය මගින් පිළිබිඹු වන ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 25.7 සිට රුපියල් බිලියන 27.0ක් දක්වා සුළු වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මාසික පිරිවැටුම් අනුපාතය[9] මගින් පිළිබිඹු වන වෙළඳපොළ

9 යම් මාසයකට අදාළව වාර්ෂික පදනම මත ගණනය කළ ද්විතීයික වෙළඳපොළ පිරිවැටුම, එම මාසය අවසානය වන විට නොපියවා ඇති රජයේ සුරැකුම්පත්වල අගයෙන් බෙදීමෙන් පිරිවැටුම් අනුපාතය ගණනය කරනු ලබයි.

2


ද්‍රවශීලතාවය, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පහළ ගියේය. 2024 අගෝස්තු සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ දී පැවති පහළ වෙළෙඳපොළ පිරිවැටුම හේතුවෙන්, 2023 වසරේ දී 41.5ක් ලෙස පැවති සාමාන්‍ය පිරිවැටුම් අනුපාතය 2024 වසරේ දී 37.2ක් දක්වා අඩු වීම, මෙම වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ පහළ යෑමට හේතු විය.

**2024 වසරේ සැප්තැම්බර් මාසය දක්වා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විදේශීය ආයෝජකයන්ගේ ඉල්ලුම අඩු මට්ටමක පැවතුණු නමුත්, වසර අවසානය වන විට එම ඉල්ලුමේ ඉහළ යෑමක් වාර්තා විය.** ඒ අනුව, 2023 වසරේ වාර්තා වූ එ. ජ. ඩොලර් මිලියන 210.0ක ශුද්ධ විදේශ ගලාඒමට සාපේක්ෂව 2024 වසර තුළ එ. ජ. ඩොලර් මිලියන 178.9ක ශුද්ධ විදේශ ගලායෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2024 අවසාන කාර්තුවේ දී එ. ජ. ඩොලර් මිලියන 77.4ක ශුද්ධ විදේශ ගලාඒමක් වාර්තා විය.

## කොටස් වෙළෙඳපොළ


**කොටස් වෙළෙඳපොළ, 2024 වසර තුළ දී ඉහළ කාර්යසාධනයක් ළඟා කරගනිමින් මිල දර්ශකවල වාර්තාගත වර්ධනයක් සමඟ වෙළෙඳපොළ පිරිවැටුමේ සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී.** කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය, 2024 වසරේ දෙසැම්බර් 31 වන දින වන විට පිළිවෙළින් 49.7%කින් සහ 58.5%කින් වර්ධනය විය. 2024 වසර තුළ දී, කොටස් වෙළෙඳපොළෙහි සමස්ත උපනතීන් සඳහා ප්‍රධාන ලැයිස්තුගත සමාගම්වල ඉහළ දායකත්වය ඉස්මතු කරමින්, සමස්ත කොටස් මිල දර්ශකයේ හැසිරීම එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයේ හැසිරීම සමඟ සමීප අනුගතවීමක් පෙන්නුම් කරන ලදී. වෙළෙඳපොළ මිල දර්ශක 2024 සිව්වන කාර්තුව

**2.6 රූප සටහන: මිල දර්ශකවල විචලනයන් සහ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය**




මූලය: කොළඹ කොටස් හුවමාරුව

**2.7 රූප සටහන: කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශීය සහභාගීත්වය (ද්විතීයික වෙළෙඳපොළ)**




මූලය: කොළඹ කොටස් හුවමාරුව

තුළ දී කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගත් අතර, දේශීය ආයෝජකයන්ගේ ඉහළ සහභාගීත්වය ඊට ප්‍රධාන දායකත්වයක් සපයන ලදී. ඒ අනුව, 2024 වසරේ තෙවන කාර්තුව දක්වා වාර්තා කළ 11.3%ක සහ 12.6%ක වර්ධනයන්ට සාපේක්ෂව, 2024 සිව්වන කාර්තුව තුළ දී, සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය පිළිවෙළින් 34.5%ක සහ 40.8%ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2024 වසර අවසානයේ දී කොටස් වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 5,695.6ක් ලෙස පැවතුණු අතර, එය 2023 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 4,248.9ක අගයට සාපේක්ෂව 34.1%ක ඉහළ යෑමකි. මේ අතර, 2024 වසර තුළ දී කොළඹ කොටස් වෙළෙඳපොළ රුපියල් මිලියන 2,240.2ක සාමාන්‍ය දෛනික පිරිවැටුමක් වාර්තා කළ අතර, එය 2023 වසර තුළ දී වාර්තා වූ රුපියල් මිලියන 1,696.2ක අගයට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමකි. කෙසේ වෙතත්, සාමාන්‍ය දෛනික ගනුදෙනු ප්‍රමාණය, 2023 වසරේ වාර්තා වූ ගනුදෙනු 14,972ට සාපේක්ෂව 2024 වසරේ දී ගනුදෙනු 14,684ක් දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කළ අතර, 2024 වසරේ තෙවන කාර්තුවේ දී ආයෝජකයන්ගේ වෙළෙඳපොළ සහභාගීත්වය පහළ යෑම ඊට මූලික වශයෙන් හේතු විය.

**කොළඹ කොටස් වෙළෙඳපොළ, මිල දර්ශකවලට සහ පිරිවැටුමට අදාළව කැපී පෙනෙන කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, ද්විතීයික වෙළෙඳපොළෙහි ශුද්ධ විදේශ ගලා යෑමක් වාර්තා විය.** ඒ අනුව, 2023 වසර තුළ දී ද්විතීයික කොටස් වෙළෙඳපොළෙහි වාර්තා වූ රුපියල් බිලියන 4.3ක්, එනම් ආසන්න වශයෙන් එ. ජ. ඩොලර් මිලියන 13.3ක් වූ ශුද්ධ විදේශ ගලාඒමට සාපේක්ෂව, 2024 වසර තුළ දී රුපියල් බිලියන 9.9ක්, එනම් ආසන්න වශයෙන් එ. ජ. ඩොලර් මිලියන 32.6ක් වූ ශුද්ධ විදේශ ගලායෑම් වාර්තා විය. කෙසේ වෙතත්, රුපියල් බිලියන 20.3ක්, එනම් ආසන්න වශයෙන් එ. ජ. ඩොලර් මිලියන 65.5ක් වූ ප්‍රාථමික

කොටස් වෙළඳපොළෙහි ඉහළ විදේශ ගලාඒම්වල දායකත්වයෙන්, සමස්ත කොටස් වෙළඳපොළ ශුද්ධ විදේශ ගලා ඒමක් වාර්තා කරන ලදී.

**කොළඹ කොටස් වෙළඳපොළෙහි අනාගත වර්ධන විභවය පිළිබඳ ආයෝජකයන් තුළ පවතින ධනාත්මක අපේක්ෂාවන් පිළිබිඹු කරමින්, 2024 වසර තුළ මිල පොත් අගය (Price to Book Value) ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී.** ඒ අනුව, 2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ 0.9ක් ලෙස පැවති මිල පොත් අගය, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට 1.2ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවති 11.1ක අගයට සාපේක්ෂව, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට මිල ඉපැයීම් අනුපාතය (Price Earnings Ratio) 8.9ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2023 වසරේ දී නව කොටස් මූලික මහජන නිකුතු දෙකක් මගින් රැස් කරගත් රුපියල් බිලියන 0.8ට සාපේක්ෂව, 2024 වසර තුළ දී කොටස් වෙළඳපොළ නව කොටස් මූලික මහජන නිකුතු හතරක් සිදු කරමින් රුපියල් බිලියන 2.8ක් රැස් කරන ලදී.

### සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

**2024 වසරේ දී වාණිජ පත්‍ර (Commercial Papers) නිකුත් කිරීම 2023 වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, එමගින් වසර තුළ ශක්තිමත් කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී.** 2024 වසර තුළ දී වාණිජ පත්‍ර නිකුත් කිරීම මගින් රුපියල් බිලියන 3.1ක් රැස් කරගත් අතර, 2023 වසරේ දී එම අගය රුපියල් බිලියන 1.3ක් විය. තවද, 2023 වසරේ දී වාර්තා වූ 17.00% සිට 26.50% දක්වා වූ පරාසයට සාපේක්ෂව, වාණිජ පත්‍රවල පොලී අනුපාතික 2024 වසර තුළ දී 12.00% සිට 13.75% දක්වා වූ පරාසයක විචලනය විය.

**සාර්වමූල්‍ය තත්ත්වයන්ගේ යහපත් ප්‍රවණතා සමඟ හටගත් ආයෝජක ආකර්ෂණය වැඩි වීම හේතුවෙන්, 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී සාංගමික ණයකර වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කරන ලදී.** 2023 වසරේ දී බැංකු පහක් විසින් කොළඹ කොටස් වෙළඳපොළ තුළ සාංගමික ණයකරවල මූලික නිකුතු 15ක් මගින් රුපියල් බිලියන 34.6ක් රැස් කරන ලදී. ඊට සාපේක්ෂව, 2024 වසර තුළ දී සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින්, සමාගම් නවයක් විසින් සාංගමික ණයකරවල මූලික නිකුතු 28ක් මගින් රුපියල් බිලියන 94.8ක් රැස් කරන ලදී. ස්ථාවර පොලී අනුපාතික සහිත ණයකර 2024 වසර තුළ දී නිකුත් කරන ලද අතර, පසුගිය වසරේ පැවති 13.50% සිට 29.50% දක්වා වූ පරාසයට සාපේක්ෂව, 2024 වසරේ දී එම පොලී අනුපාතික 12.00% සිට 15.25% දක්වා වූ පරාසයක පැවතුණි.

## 2.4 මූල්‍ය අන්තර්ගතභාවය

**2024 වසරේ දී, රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ඒ අනුව, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය (2021 - 2024) මත පදනම්ව, ඩිජිටල් මූල්‍යකරණ සහ ගෙවීම්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍යකරණ, පාරිභෝගික ආරක්ෂණය සහ මූල්‍ය සාක්ෂරතාවය යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ මහ බැංකුව, මූල්‍ය සාක්ෂරතාවය සහ අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය. තවද, මහ බැංකුව, එහි ප්‍රාදේශීය කාර්යාල සමඟ එක්ව 2024 වසරේ දී දීපව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 400කට අධික ප්‍රමාණයක් පැවැත්වීය. 2024 වසරේ මැයි මාසයේ දී "මූල්‍ය පිරිපුන් බවින් යුත් ශ්‍රී ලංකාවක්" බිහි කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය එළි දැක්වීම ද සිදු විය. මෙම මාර්ගෝපදේශය යටතේ, රටපුරා මූල්‍ය සාක්ෂරතා පුහුණුකරුවන්ගේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා "මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සහතිකලත් පුහුණුකරු" නමින් නව වැඩසටහනක් හඳුන්වා දීමට නියමිත අතර "මූල්‍ය සාක්ෂරතා මාසය" 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත. මීට අමතරව, පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට මූල්‍ය කළමනාකරණය, ණය බර අඩු කිරීම, ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම, තිරසර මූල්‍ය හැසිරීම් අනුගමනය කිරීම සහ එමගින් මූල්‍ය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීම යන අරමුණු ඇතිව ණය උපදේශන මධ්‍යස්ථානය නැවත ස්ථාපිත කිරීමට මහ බැංකුව කටයුතු කළේය.


## 2.5 මූල්‍ය යටිතල පහසුකම්

### ගෙවීම් සහ පියවීම් පද්ධති

**2024 වසර තුළ දී, රට තුළ පවතින ගෙවීම් සහ පියවීම් පද්ධති අඛණ්ඩව සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වූ අතර, වැඩි පිරිසක් ඩිජිටල් ගනුදෙනු වෙත යොමු වීම ද නිරීක්ෂණය කරන ලදී.** තවද, චෙක්පත් වැනි සාම්ප්‍රදායික ගෙවීම් උපකරණවලට සාපේක්ෂව, විශාල සහ කුඩා වටිනාකම්වලින් යුත් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද සඳහා මහජනතාවගේ අනුගතවීම අඛණ්ඩව වර්ධනය විය. මෙම වර්ධනයට ඩිජිටල් ගෙවීම් ක්‍රම මගින් ලබා දෙන පහසුව සහ ආරක්ෂාව හේතු වන ලදී. ඩිජිටල් ගෙවීම් ක්‍රම භාවිත කිරීම පිළිබඳ මහජන විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීම සඳහා, ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ උපදේශන කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය 2024 වසර තුළ දී පියවර කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, 2025 වසරේ මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි ජංගම ගෙවීම් යෙදුමකට ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධ කිරීමේ දී ජංගම දුරකථන අංකය සත්‍යාපනය කිරීම අනිවාර්ය කිරීම ඉන් එක් ප්‍රධාන පියවරක් විය.

2

**2.8 රූප සටහන: කුඩා වටිනාකම් සහිත ගනුදෙනු**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රටෙහි ක්ෂණික ගෙවීම් පද්ධතිය[10] වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch – CEFTS) හරහා විශාල වශයෙන් ඩිජිටල් ගනුදෙනු වෙත යොමු වීමක් 2024 වසර තුළ දී දක්නට ලැබුණි.** මෙම යාන්ත්‍රණය හරහා සිදු කරන ලද කුඩා වටිනාකම් සහිත ඩිජිටල් ගෙවීම්වල වටිනාකම, සියලු අන්තර් බැංකු කුඩා වටිනාකම් සහිත ගෙවීම්වල වටිනාකමෙන් 50%ක් වූ අතර, එමගින් කුඩා වටිනාකම් සහිත ගෙවීම් සඳහා ක්ෂණික ගෙවීම් පද්ධතිය මත පදනම් වූ ගෙවීම් ක්‍රමවේද භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මහජනතාවට රාජ්‍ය ආයතන සඳහා ආදායම් බදු, රේගු බදු ආදිය ගෙවීමට හැකියාව ලබා දෙන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform - LPOPP), QR කේත භාවිතයෙන් වෙළඳුන්ට ගෙවීම් සඳහා පහසුකම් සපයන LANKAQR සහ ජංගම ගෙවීම් යෙදුමකට ඕනෑම මූල්‍ය ආයතනයක ඇති ගනුදෙනුකරුවන්ගේ ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධ කිරීමෙන් ගෙවීම් සිදු කිරීමට ඉඩ සලසන ජස්ට්පේ (JustPay) යනාදී ගෙවීම් ක්‍රම සඳහා ක්ෂණික ගෙවීම් පද්ධතිය හරහා පහසුකම් සැලසේ.

**2024 වසර තුළ දී, ISO 20022 ප්‍රමිතියට අනුකූල වන නව තත්කාලීන දළ පියවීම් (Real Time Gross Settlement - RTGS) පද්ධතිය වන LankaRTGS හරහා වැඩි මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සහ ඉහළ අවදානම් කළමනාකරණ හැකියාවන් හඳුන්වා දෙන ලදී.** තවද, ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම යන දෙකෙහිම සිදු වූ පිළිවෙළින් 10.1%ක සහ 25.7%ක වාර්ෂික වර්ධනයෙන් පිළිබිඹු වන පරිදි, ගනුදෙනුකරුවන්ගේ විශාල වටිනාකමින් යුතු ගෙවීම් සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතියේ භාවිතය තවදුරටත් ඉහළ යන ලදී.

**වසර තුළ දී ජාතික ගෙවීම් යටිතල පහසුකම්, ජාත්‍යන්තර ගෙවීම් ජාල සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ (LankaPay/UnionPay) සම-සන්නාමගත කාඩ්පතක් නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් වන යුනියන්පේ ඉන්ටර්නැෂනල් (UnionPay International) සමඟ සම්බන්ධ වීමට මහ බැංකුව විසින් සුළු පරිමාණ ගෙවීම් ජාල ක්‍රියාකරු වන ලංකාපේ පුද්ගලික සමාගම වෙත අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ලංකාපේ පුද්ගලික සමාගම හරහා දේශීය ගනුදෙනු සඳහා පහසුකම් සලසන ජාතික ගෙවීම් කාඩ්පත්, ජේ.සී.බී. ඉන්ටර්නැෂනල් හෝ යුනියන්පේ ඉන්ටර්නැෂනල් සමඟ සම-සන්නාමගත කළ හැකි වේ. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය මගින් රටෙහි ගෙවීම් යටිතල පහසුකම් සඳහා වැඩි ස්වාධීනත්වයක් ගෙන ඒමට සහ දේශීය ගෙවීම් සිදු කිරීමේ දී සේවා ගාස්තු ලෙස විදේශ විනිමය රටින් පිටතට ගලා යෑම අඩු කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, NEPALPAY සහ WeChat Pay වැනි ජංගම යෙදුම්වලට LANKAQR සමඟ සම්බන්ධ වීමට ද මහ බැංකුවේ අනුමැතිය හිමි විය. ඉන්දියාවේ Unified Payments Interface (UPI) සහ චීනයේ යුනියන්පේ ඉන්ටර්නැෂනල් සමඟ LANKAQR ඒකාබද්ධ කිරීම හරහා දැනටමත් ලබාගෙන ඇති ප්‍රවේශය මෙම නව සම්බන්ධතා මගින් පුළුල් කෙරෙන අතර, මෙම ඒකාබද්ධ ජාලවලට සම්බන්ධ ජංගම යෙදුම් භාවිතා කරන සංචාරකයින්ට ශ්‍රී ලංකාවේ දී තම ජංගම යෙදුම් භාවිතා කරමින් LANKAQR හරහා ගනුදෙනු බාධාවකින් තොරව සිදු කිරීමට පහසුකම් සපයයි. මීට අමතරව, අන්තර්ජාල වංචාවලින් පැන නගින අවදානම් සහ අලාභයන් අවම කිරීම සඳහා, ඩිජිටල් ගනුදෙනු සිදු කිරීමේ ආරක්ෂිත ක්‍රම පිළිබඳව මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමට මහ බැංකුව ගෙවීම් ක්ෂේත්‍රයේ අනෙකුත් හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරීව කටයුතු කළේය.

10 වේගවත් ගෙවීම් ලෙස ද හැඳින්වෙන ක්ෂණික ගෙවීම් පද්ධතිය, ගනුදෙනුකරුවන් අතර තත්කාලීනව අරමුදල් මාරු කිරීම කරනු ලබයි.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

**මූල්‍ය අංශයේ සුපිළිපන්භාවය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම (AML/ CFT) පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව ක්‍රියාත්මක විය.** 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව, 2024 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය, වාර්තා වී ඇති සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීම, නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් සමඟ මූල්‍ය බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීම සහ මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ රෙගුලාසිවලට මූල්‍ය සහ නම් කරන ලද මූල්‍ය නොවන ආයතනික අනුගත වීම සහතික කිරීම සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ රෙගුලාසිවලට අනුකූල නොවීම මත මූල්‍ය ආයතන හයකට සහ නම් කරන ලද මූල්‍ය නොවන ආයතනික ව්‍යාපාරයක් සඳහා රුපියල් මිලියන 8.75ක දඩ මුදල් පැනවීය. තවද, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව, ඊට අදාළ ජාතික සම්බන්ධීකරණ අංශය වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව (National Coordinating Committee) මගින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. මහ බැංකු අධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් සැපයීම සහ පාර්ශ්වකරුවන් අතර ජාතික මට්ටමේ සම්බන්ධීකරණය සඳහා පහසුකම් සලසයි. ඊට අමතරව, සමාලෝචනයට භාජනය වන වසර තුළ, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සහ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යන පනත් සඳහා වූ සංශෝධන අවසන් කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව කටයුතු සිදු කරන ලදී. එමෙන්ම, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත, 2007 අංක 07 දරන සමාගම් පනත සඳහා වූ සංශෝධන කෙටුම්පත, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීමේ) පනත සඳහා වූ සංශෝධන සහ සුදු නියාමන අධිකාරී පනත් කෙටුම්පත ඇතුළු නව අණ පනත් සමාලෝචනය කර සංශෝධන කිරීම සඳහා පැවති නීති කෙටුම්පත් කමිටුවලට ද මූල්‍ය බුද්ධි ඒකකය ක්‍රියාකාරීව සහභාගී විය. ඊට අමතරව, නිශ්චල දේපළ මිලට ගැනීම සහ විකිණීමට අදාළ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන කාර්ය සාධක බලකායට ද මූල්‍ය බුද්ධි ඒකකය දායක විය.

## මූල්‍ය අංශයට අදාළ නීති ප්‍රතිසංස්කරණ

**මහ බැංකුව, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණවල අඛණ්ඩව නිරත විය.** 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම අරමුණු කරගනිමින් 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත නීතිගත කරන ලද අතර, එය 2024 ජුනි 15 දින සිට බලාත්මක විය. තවද, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම සඳහා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත අවශ්‍ය සහාය ලබා දෙන ලද අතර, ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත සහ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිළිබඳ පනත යන පනත් කෙටුම්පත් කිරීමේ දී ද ඊට අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරන ලදී. තවද, 2024 වසරේ දී මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යන පනත්වලට අදාළව සංශෝධන කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදී.

## මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

**2024 වසර තුළ දී මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි, 2024 වසරේ අගෝස්තු 09 වන දින සිට පූර්ණ වශයෙන් බලාත්මක විය. මීට සමගාමීව, අවදානම් මත පදනම් වූ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණයට අදාළව, පූර්ණ විෂය පථයම ආවරණය වන පළමු එතැන් පරීක්ෂණය 2024 වසරේ දෙවැනි කාර්තුවේ දී සිදු කරන ලදී. තවද, ඉහළ ණය අනුපාත, අධික ගාස්තු හා අයකිරීම් සහ මූල්‍ය සේවා සපයන්නන් විසින් පනවන ලද කොමිස් වැනි ක්ෂේත්‍රයන් ඉලක්ක කොටගෙන, සීමිත විෂයපථයක් ආවරණය වන එතැන් පරීක්ෂණ කිහිපයක් 2024 වසරේ තෙවන කාර්තුවේ දී සිදු කරන ලදී. එමෙන්ම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය පාරිභෝගිකයන් හා මූල්‍ය සේවා සපයන්නන් සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම්, වගකීම් සහ යහපත් පරිචයන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවන් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. සමස්තයක් ලෙස, මෙම ක්‍රියාමාර්ග මගින් විනිවිදභාවය

වැඩිදියුණු වීම, පාරිභෝගිකයන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ඵලදායීව ක්‍රියාත්මක කිරීම මෙන්ම, මූල්‍ය අංශය තුළ මූල්‍ය පාරිභෝගිකයා කේන්ද්‍ර කොටගත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සිදු විය.

### තැන්පතු රක්ෂණ සහ නිරාකරණ අධිකාරිය

**මහ බැංකුව විසින් බැංකු සහ මුදල් සමාගම් සඳහා වන නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වැදගත් පියවර ගන්නා ලදී.** 2023 වසර අග භාගයේ දී 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමෙන් අනතුරුව, නිරාකරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම, බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ ප්‍රේරක සහ නිරාකරණ සැලසුම්කරණ ක්‍රියාවලියට සහාය වීමට සම්මත දත්ත ආකෘති නිර්මාණය කිරීම ඇතුළු නිරාකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි මහ බැංකුවේ අවධානය යොමු විය. මීට අමතරව, නිරාකරණ ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සහ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා රජයේ මූලික ප්‍රතිපාදන සහිතව මූල්‍ය ස්ථායීතා අරමුදලක් ද පිහිටුවන ලදී.

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි පරිපාලක ලෙස, බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව කටයුතු කළේය.** මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මූල්‍ය පසුගාමී අරමුදල් සැකසුම (Fiscal back stop funding arrangement) පිහිටුවීම වෙනුවෙන් මහ බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණි. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය හා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා, ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් සමඟ මහ බැංකුව සම්බන්ධ විය. මෙම ව්‍යාපෘතිය යටතේ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල් අමාත්‍යාංශය[11] සහ මහ බැංකුව ණය ගිවිසුම් කිහිපයකට එළඹුණි. 2024 වසරේ දෙසැම්බර් මාසය වන විට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එ. ජ. ඩොලර් මිලියන 100ක මුදලක් මුදාහරින ලද අතර, එය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට අයත් එ. ජ. ඩොලර්වලින් නාමනය කරන ලද ආරක්ෂිත සංවෘත ගිණුමක (Ring-Fenced) පවත්වා ගෙන යනු ලැබේ. මීට සමගාමීව, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි විසර්ජක කොන්දේසි ලෙස පවතින ප්‍රතිපත්ති පාදක වැඩිදියුණු කිරීම් සහ ආයතනික ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් කිහිපයක, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නිරත වී සිටියි. 2024 වසර අවසන් වන විට, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි හිමිකම් වශයෙන්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල ලෙස රුපියල් බිලියන 136.9ක් සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් සංචිත ලෙස රුපියල් බිලියන 11.8ක් පැවතුණි.

**තවද, බලපත්‍ර අවලංගු කළ මුදල් සමාගම් සඳහා වන්දි ගෙවීම් සම්බන්ධ කටයුතුවල ද මහ බැංකුව නිරත විය.** බලපත්‍ර අවලංගු කරන ලද සහ අත්හිටුවන ලද මුදල් සමාගම් තුනක තැන්පත්කරුවන් සඳහා 2024 වසර තුළ දී රක්ෂණ වන්දි ගෙවීම් මහ බැංකුව සාර්ථකව නිම කර ඇති අතර තවත් එක් සමාගමක් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් තවදුරටත් සිදුකරමින් පවතී. මෙම ගෙවීම්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කරනු ලබන තැන්පත්කරුවන්ගේ දත්ත රැස් කිරීමේ පද්ධතිය මේ වන විට සියලුම මුදල් සමාගම් තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර, එය බලපත්‍රලාභී බැංකු වෙත ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරමින් පවතී. මෙම පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම පිළිබඳ උපදෙස් ලබා දී ඇත.

## 2.6 තිරසර මූල්‍ය

**තිරසර මූල්‍ය පෙරදැක්ම ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර මූල්‍යකරණ කාර්යයන් අඛණ්ඩව සිදු කිරීමට 2024 වසර තුළ දී මහ බැංකුව සමත් විය.** මෙම තිරසර මූල්‍ය පෙර දැක්ම 2019 වසරේ දී දියත් කර මේ වන විට වසර පහක් ගතවී ඇති බැවින්, ඉදිරි වසර පහක කාලය සඳහා තිරසර මූල්‍ය පෙරදැක්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා මහ බැංකුව 2024 වසරේ මැයි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (International Finance Corporation) සමඟ ගිවිසුමකට එළඹුණි. මෙම ගිවිසුම යටතේ, තිරසරභාවය හා බැඳුනු සමාජීය අංශ කෙරෙහි අවධානය යොමු කෙරෙන, මූල්‍ය අංශය සඳහා වන තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0හි සමාලෝචන ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින අතර, 2025 වසරේ පළමු භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කෙරේ. මහ බැංකුව, තිරසර මූල්‍යකරණය සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍ය අවදානම් පිළිබඳ දැනුම ඉහළ නංවා ගැනීමේ අරමුණින්, වසර තුළ දී දැනුම හුවමාරු හා කුසලතා වර්ධන වැඩසටහන් රාශියකට සම්පත්දායකයෙක් සහ සහභාගිවන්නෙක් යන දෙආකාරයෙන්ම සම්බන්ධ විය. තිරසර බැංකු සහ මූල්‍ය ජාලය (Sustainable Banking and Finance Network), තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාව (International Platform for Sustainable Finance) සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානය (Alliance for Financial Inclusion) යන ත්‍රිත්වයෙහි ම සාමාජිකත්වය දරන මහ බැංකුව, 2024 වසරේ දී තිරසර

11 ගිවිසුම් අත්සන් තබන අවස්ථාවේ මෙම අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලෙස පැවතුණි.

බැංකු සහ මූල්‍ය ජාලයේ ගෝලීය ප්‍රගති සංක්ෂිප්තය, තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාවේ නිත්‍ය රැස්වීම් සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානයේ හරිත මූල්‍ය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් යනාදියට සහභාගී වෙමින් ජාත්‍යන්තර සහයෝගීතාවය අඛණ්ඩව පවත්වා ගෙන ගියේය. තවද, මහ බැංකුව 2024 වසරේ දී ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍යකරණය ප්‍රචලිත කිරීමේ අරමුණින් මූල්‍ය ක්ෂේත්‍රය සමඟ අඛණ්ඩව සාකච්ඡා පැවැත්වූ අතර, විශේෂයෙන් ආයතනික අංශයේ වාණිජ මණ්ඩල සහ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වූ චින්තන පර්ශද සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී.